දුරකථන / தொலைபேசி இல. / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2369305, 011-2369302
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/8/1/44/1/1/2013
ඔබේ අංකය / உமது இல. / Your No.: 2/1/17/2/13
දිනය / திகதி / Date: 2014.02. 20

24 FEB 2014

ලේකම්,

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

<u>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීම</u>

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2014.02.06 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණය (MT-01) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, බඳවාගැනීම් පරිපාටිය අදාළ වෙබ් අඩවියේ පළකරන ලෙසත් කාරුණිකව වැඩිදුරටත් දන්වමි.

ඩබ්.බී.පී.සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -
01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)
03. අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව- (මුල් පිටපත මේ සමඟ එවමි.)

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි

## කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව — යොමු අංකය : DTET/04/AO/SOR/MT දිනය : 2013.07.15

1.2 අමාත්‍යාංශය : යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය — යොමු අංකය : 2/1/17/2/13 දිනය : 2013.08.05

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම — යොමු අංකය : DMS/C/5/46 දිනය : 2012.08.27; DMS/C/5/461 Vol I 2013.06.04

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය : EST-2/RECRU/03/2054 දිනය : 2013.01.29; EST-2/RECRU/03/2002 දිනය : 2012.01.18

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : NSCC/1/44/1/SR දිනය : 2012.12.24; NSCC/1/44/1/SR-1 දිනය : 2011.12.07

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය — යොමු අංකය : PSC/EST/8/1/44/1/1/2013 දිනය : 2013.06.25; සංශෝධිත : 2013.12.31

**02. පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 3

3.2 ශ්‍රේණි : III, II, සහ I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා ( NVQ ) මට්ටම 05 යටතට ගැනෙන්නාවූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා නිමකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත**

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : MT – 1 – 2006 ( ඒ )

5.2 වැටුප් පරිමාණය : රු.14,425-10X145–11X170–6 X 240–14X320–23,665/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| III | 01 | රු. 14,425 /- |
| II | 12 | රු. 16,045/- |
| I | 23 | රු. 17,985/- |

**06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ශිල්ප ප්‍රදර්ශක | III/II/I | 134 | 1. අදාල ක්ෂේත්‍රයේ ප්‍රායෝගික වැඩ සූදානම් කිරීම හා ඒවා ප්‍රායෝගික වශයෙන් කර පෙන්වීම.<br>2. විෂය නිර්දේශයන්ට අදාළ ඉගැන්වීමේ ආධාරක ආකෘති පිළියෙල කිරීම.<br>3. අදාළ උපකරණ හා යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම.<br>4. සිසුන්ට උපකරණ නිකුත් කිරීම හා ආපසු ලබාගැනීම.<br>5. අවශ්‍ය මගපෙන්වීම් කිරීම.<br>6. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී. |

| | | | |
|---|---|---|---|
| ගොවිපොළ කළමනාකරු | III/II/I | 03 | 1. තාක්ෂණ / කාර්මික විද්‍යාල යටතේ පවතින ගොවිපල සංවර්ධනයට අවශ්‍ය සියළු කාර්යයන්<br>2. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල කෘෂිකාර්මික අධ්‍යාපන කටයුතුවල යෙදෙන ශිෂ්‍යයන්ට ඊට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>3. ගොවිපලවල සත්ත්ව පාලනය / භෝග වගා කටයුතු සඳහා කෘෂි කම්කරුවන් යෙදවීම.<br>4. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරී |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| තනතුර | තාක්ෂණ විද්‍යාල | කාර්මික විද්‍යාල | එකතුව |
|---|---|---|---|
| ශිල්ප ප්‍රදර්ශක | 40 | 94 | 134 |
| ගොවිපල කළමනාකරු | - | 03 | 03 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

★ ගොවිපළ කළමනාකරු තනතුර

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

★ ශිල්ප ප්‍රදර්ශක තනතුර

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 80% |
| සීමිත | 20% |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

**7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :-**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් ( 06 ) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සා.පෙ,) විභාගය සමත්වී තිබීම.

**7.2.2.2 වෘත්තීය සුදුසුකම් :-**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 5 වන මට්ටමේ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හෝ පහත පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම

**7.2.2.2.1 ශිල්ප ප්‍රදර්ශක**

( අ ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලී වැඩ ශිල්පය හෝ ලෝහ වැඩ ශිල්පය හෝ මෝටර් යාන්ත්‍රික ශිල්පය හෝ විදුලි ශිල්පය හෝ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය පිළිබඳව අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම

**7.2.2.2.2 ගොවිපළ කළමනාකරු**

( අ ) කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර යන කෘෂිකර්ම විද්‍යාලයකින් කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ආ) කාර්මික විද්‍යාලයක දෑවුරුදු පුහුණුවකින් පසුව ලබාගන්නා ලද කෘෂිකර්මය පිළිබඳ ජාතික සහතික පත්‍රය / ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම

හෝ

( ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ කෘෂි විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම

හෝ

( ඈ ) ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

**7.2.2.3 පළපුරුද්ද :-**

1. රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර 01 කට නොඅඩු කාලයක් සේවයේ යෙදී පළපුරුද්දක් ලබා තිබීම.

**7.2.2.4 කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සඳහන් සියළු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

- ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා ප්‍රශ්න පත්‍ර අංක 01 හා අදාල ක්ෂේත්‍රය අනුව 02 හෝ 03 හෝ 04 හෝ 05 හෝ 06 සඳහා පෙනී සිටිය යුතුය.
- ගොවිපළ කළමනාකරු තනතුර සඳහා ප්‍රශ්න පත්‍ර අංක 01 හා 07 සඳහා පෙනී සිටිය යුතුය.

| ප්‍රශ්න පත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. ලී වැඩ ශිල්පය | 100 | 40% |
| 3. ලෝහ වැඩ ශිල්පය | 100 | 40% |
| 4. මෝටර් යාන්ත්‍රික ශිල්පය | 100 | 40% |
| 5. විදුලි ශිල්පය | 100 | 40% |
| 6. ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | 100 | 40% |
| 7. කෘෂිකර්මය | 100 | 40% |

( ලිඛිත විභාගය පිළිබඳ ආකෘතිය ඇමුණුම 01 ඇතුළත් වේ. )

7.2.4.1.1 පවත්වන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ.

| ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. අතිරේක පළපුරුද්ද | 30 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 | |
| 5. පරිගණක හැකියාව | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **මුළු ලකුණු** | 100 | |

සටහන : ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම : ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා පමණක් සීමිත පදනම මත බඳවා ගනු ලැබේ.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

**7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :-**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් ( 06 ) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සා.පෙ,) විභාගය සමත්වී තිබීම.

7.3.2.2 **වෘත්තීය සුදුසුකම් :-**

( අ ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 4 වන මට්ටමේ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක්

හෝ

( ආ ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලී වැඩ ශිල්පය හෝ ලෝහ වැඩ ශිල්පය හෝ මෝටර් යාන්ත්‍රික ශිල්පය හෝ විදුලි ශිල්පය හෝ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය පිළිබඳව අවුරුදු එකක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම

7.3.2.3. **පළපුරුද්ද** : අයදුම්පත් කැඳවන දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට අයත් තනතුරක ස්ථිර පත්වීමක් ලැබ යටත් පිරිසෙයින් අවුරුදු 07 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

7.3.2.4 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 **වෙනත්** :

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3 දක්වා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස :

7.3.3.1 අවම සීමාව : අවුරුදු 25

7.3.3.2 උපරිම සීමාව : අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය :

- ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා ප්‍රශ්න පත්‍ර අංක 01 හා අදාල ක්ෂේත්‍රය අනුව 02 හෝ 03 හෝ 04 හෝ 05 හෝ 06 සඳහා පෙනී සිටිය යුතුය.

| ප්‍රශ්න පත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. ලී වැඩ ශිල්පය | 100 | 40% |
| 3. ලෝහ වැඩ ශිල්පය | 100 | 40% |
| 4. මෝටර් යාන්ත්‍රික ශිල්පය | 100 | 40% |
| 5. විදුලි ශිල්පය | 100 | 40% |
| 6. ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | 100 | 40% |

( ලිඛිත විභාගය පිළිබඳ ආකෘතිය ඇමුණුම 01 ඇතුළත් වේ. )

7.3.4.1.1 පවත්වන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ.

| ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. අතිරේක පළපුරුද්ද | 30 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 | |
| 5. පරිගණක හැකියාව | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **මුළු ලකුණු** | **100** | |

සටහන : ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ප්‍රසිද්ධ අභ්‍යන්තර නිවේදනයක් මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින්

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. **කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය / සහතික පාඨමාලා / වෙනත්** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන ( 03 ) ක් ගතවීමට පෙර | ලිඛිත ( ඇමුණුම 02 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන ( 03 ) ක් ගතවීමට පෙර | ලිඛිත / වෘත්තීය (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර පහ ( 05 ) ක් ගතවීමට පෙර | ලිඛිත ( ඇමුණුම 04 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ආයතනයක් මගින්

09. **භාෂා ප්‍රවීණතාව**

9.1

| **භාෂාව** | **ලබා ගත යුතු ප්‍රවීණතාව** |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. **ශ්‍රේණි උසස් කිරීම**

10.1 **III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර ( 10 ) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

## 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය ( 10 ) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ ( 05 ) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය ( 10 ) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

**සටහන :**

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : "සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සේවයේ යෙදී සිටින නිලධාරින් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය :-

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක : PSC/EST/3/1/32 හා 2012.11.22 දිනැතිව දන්වා ඇති පරිදි 2012.09.04 වන දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 03 නිලධර ගණය ( ශිල්ප ප්‍රදර්ශක ) තනතුර සඳහා වූ උසස් කිරීමේ පරිපාටිය යටතේ 2012.09.04 වන දිනට සේවයේ යෙදී සිටි ශිල්ප ප්‍රදර්ශක නිලධාරීන් එම උසස් කිරීමේ පරිපාටියේ සඳහන් අන්තර්ග්‍රහණ ක්‍රමවේදය යටතේ අන්තර්ග්‍රහණය කර ඇති බැවින් ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අන්තර්ග්‍රහණ ක්‍රමවේදය අදාළ නොවේ.

ඒ අනුව මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින ගොවිපළ කළමනාකරු තනතුර දරන නිලධාරියාට පමණක් පහත අන්තර්ග්‍රහණ ක්‍රමවේදය අදාළ වේ.

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 හා ඊට අනුෂංගික චක්‍රලේඛ මගින් ලබාදී ඇති MT –1– 2006 (A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරියා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධානවලට අනුව III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තන් අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :- අත්සන : ........................

( විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා )

නම : ........................

තනතුර : ........................

දිනය : 2014/01/24

පරීක්ෂා කළේ :- අත්සන : ........................

( විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා )

බී. පී. සී. කුලරත්න

අධ්‍යක්ෂ (පරිපාලන)

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ඕල්කට් මාවත, කොළඹ - 10.

නම : ........................

තනතුර : ........................

දිනය : 2014/01/24

නිර්දේශ ඉදිරිපත් කරමි.

අත්සන : ........................

( දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ),

නිලමුද්‍රාව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10.

දිනය : 2014/01/24

යොමු අංකය : 2/1/17/2/13

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර ( තාක්ෂණික ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................

නම : ඩබ්ලිව්. ඩී. ජයවික්‍රම

( ලේකම් ) අතිරේක ලේකම් (පරිපාලන හා මූල්‍ය) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

"නිපුණතා පියස" 354/2, ඇල්විටිගල මාවත, කොළඹ - 05.

නිලමුද්‍රාව : ........................

දිනය : 2014.02.03

යොමු අංකය : PSC/ESC/2/1/44/1/1/2013

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර ( තාක්ෂණික ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013.06.25 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී,

අත්සන : ........................

නම : ........................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014 02.19

නිලමුද්‍රාව : ........................

ඇමුණුම 01

1. විභාගයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 3 සේවා ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. ලී වැඩ ශිල්පය | පැය 02 | 100 | 40% |
| 3. ලෝහ වැඩ ශිල්පය | පැය 02 | 100 | 40% |
| 4. මෝටර් යාන්ත්‍රික ශිල්පය | පැය 02 | 100 | 40% |
| 5. විදුලි ශිල්පය | පැය 02 | 100 | 40% |
| 6. ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | පැය 02 | 100 | 40% |
| 7. කෘෂිකර්මය | පැය 02 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලීන, සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර්ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි |
| 2. ලී වැඩ ශිල්පය | ලී වැඩ ( න්‍යාය ), ලී වැඩ යාන්ත්‍රණ ශිල්පය, කාර්මික චිත්‍ර, සන්නිවේදන හැකියාව, ගණිතය, පිරිද්දුම් වැඩ, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය |
| 3. ලෝහ වැඩ ශිල්පය | ඉංජිනේරු විද්‍යාව, සන්නිවේදන හැකියාව, කාර්මික ඇඳීම, වැද්දුම් යාන්ත්‍රණ ශිල්පය ( න්‍යාය ), වාත්තු වැඩ. |
| 4. මෝටර් යාන්ත්‍රික ශිල්පය | ඉංජිනේරු ඇඳීම හා නිර්මාණය, නිෂ්පාදන තාක්ෂණය, යාන්ත්‍රික නඩත්තුව හා බලශක්ති කළමනාකරණය, ස්වයංචල තාක්ෂණය, පෙට්‍රල් / ඩීසල් එන්ජින්, මෝටර් රථ විදුලි කාර්මික |

| | |
|---|---|
| 5. විදුලි ශිල්පය | විදුලි යන්ත්‍ර, බල විද්‍යුතය හා ස්වයංවල පාලන පද්ධති, ක්ෂුද්‍ර සැකසුම් පාදක පද්ධති, ව්‍යවහාරික විදුලි මිණුම්, විදුලි රැහැන් ඇදීම |
| 6. ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම, ඉදිකිරීම් බිම් මැනීම, ජලය පිරිපහදුව හා කසල ජලය බැහැරලීම, ව්‍යුහ න්‍යාය හා සැලසුම්, ප්‍රමාණ සමීක්ෂණය |
| 7. කෘෂිකර්මය | බෝග පාලනය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය හා පශු විද්‍යාව, පැළෑටි ආරක්ෂණය, කෘෂි ඉංජිනේරු විද්‍යාව, පසු අස්වනු තාක්ෂණය හා කිරි තාක්ෂණය, කෘෂි ආර්ථික විද්‍යාව, කෘෂි වෙළඳ කළමනාකරණය සහ මූලික ගිණුම්කරණය, කෘෂිකාර්මික ව්‍යාප්ති අධ්‍යාපනය, කෘෂි ව්‍යාපාර සඳහා පරිගණක භාවිතය, කෘෂිකර්මය සඳහා ඉංග්‍රීසි |

සකස් කළේ :-

අත්සන : ..............................

නම : ..............................

තනතුර : ..............................

දිනය : 2014/01/24

පරීක්ෂා කළේ :-

අත්සන : ..............................

නම : බී. පී. සී. කුලරත්න

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඕල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2014/01/24

අත්සන ( දෙපාර්තමේන්තු ප්‍රධාන )

..............................

නම : [illegible]

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ),

දිනය : 2014/01/24 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,

නිලමුද්‍රාව තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10.

9

ඇමුණුම - 02

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති සංග්‍රහය | 1. ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ පරිච්ඡේද VII, VIII,XII,XIII,XIV,XV,XVI,XLVII<br>2. II කාණ්ඩයේ XLVII පරිච්ඡේදය<br>3. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I බාණ්ඩය |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ I,II,III,හා IV වැනි පරිච්ඡේද<br>1. මුදල් රෙගුලාසි 1 – 72 දක්වා<br>2. මුදල් රෙගුලාසි 90 – 115 දක්වා<br>3. මුදල් රෙගුලාසි 124 – 147 දක්වා<br>4. මුදල් රෙගුලාසි 212 -235 දක්වා |

සකස් කළේ :-

අත්සන : ....................

නම : ....................

තනතුර : ....................

දිනය : 2014/01/24

පරීක්ෂා කළේ :-

අත්සන : ....................

නම : බී. පී. සී. කු...

තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඔල්කට් මාවත, කොළඹ - 10.

දිනය : 2014/01/24

අත්සන ( දෙපාර්තමේන්තු ප්‍රධාන )

....................

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,

තනතුර : ....................

දිනය : 2014/01/24

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ),
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557, ඔල්කට් මාවත, කොළඹ - 10.

නිලමුද්‍රාව....................

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

– ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා වෘත්තීය පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 100 | 40% |

– ගොවිපළ කළමනාකරු තනතුර සඳහා ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

– වෘත්තීය පරීක්ෂණය සඳහා

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. නිපුණතාවය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | ලී වැඩ ශිල්පය, ලෝහ වැඩ ශිල්පය, මෝටර් යාන්ත්‍රික ශිල්පය, විදුලි ශිල්පය, ගොඩනැගිලි ශිල්පය යන ක්ෂේත්‍ර අතුරින් නිලධාරියාගේ තනතුරට අදාල ක්ෂේත්‍රයේ ඉදිරිපත් කරන කාර්යය ප්‍රායෝගිකව ඉටු කරමින් ඒ දෙය විස්තරාත්මකව ප්‍රදර්ශනය කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා දැනට තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි භාවිතා කරන විෂය නිර්දේශයන්හි අඩංගු ප්‍රධාන ප්‍රායෝගික වැඩ කොටස් සිදු කරන ආකාරය සිසුන්ට පැහැදිලිව අවබෝධ වන ආකාරයට ප්‍රදර්ශනය කර පෙන්විය යුතුය. |

– ලිඛිත පරීක්ෂණය සඳහා

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | බෝග නිෂ්පාදනය, පළිබෝධ පාලනය, සත්ත්ව පාලනය, ඒකාබද්ධ ගොවිතැන, මත්ස්‍ය කර්මාන්තය, පාංශු හා ජල කළමනාකරණය, ශාක කාය කර්මය ( Plant Physiology ) |

සකස් කළේ :-
අත්සන : ....................
නම : ....................
තනතුර : ....................
දිනය : 2014/01/24

පරීක්ෂා කළේ :-
අත්සන : ....................
නම : බී. සී. සී. කුලරත්න
තනතුර : අධ්‍යක්ෂ (පරිපාලන)
දිනය : 2014/01/24
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඔල්කට් මාවත, කොළඹ - 10.

අත්සන ( දෙපාර්තමේන්තු ප්‍රධාන ) ....................
නම : ....................
තනතුර : ....................
දිනය : 2014/01/24
නිලමුද්‍රාව : ....................

ජේ. ක්‍රිෂ්ණමූර්ති,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ),
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557, ඔල්කොට් මාවත, කොළඹ - 10.

ඇමුණුම - 04

1. පරීක්ෂණයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර ( තාක්ෂණ ) ඛණ්ඩ 3 සේවා ගණය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්.

5. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. පොදු ප්‍රශ්න පත්‍රය | **ශිල්ප ප්‍රදර්ශක**<br>1. තම ක්ෂේත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රයේ තෝරාගත් විෂය කොටසක් සඳහා ප්‍රායෝගික වැඩ සැලැස්මක් සකස් කිරීම.<br>2. ඉගැන්වීම් ආධාරක, ආකෘති පිළියෙල කිරීම.<br>3. අදාළ උපකරණ, මෙවලම්, ආයුධ හා යන්ත්‍ර සූත්‍රවලට අදාළ ඉන්වෙන්ට්‍රි නඩත්තුව<br>4. වැඩහල් පරිපාලනය<br><br>**ගොවිපළ කළමනාකරු**<br>1. ගොවිපළ සංවර්ධන සැලසුම් සකස් කිරීම<br>2. ගොවිපළ සංවර්ධන සඳහා සංවිධානය කිරීම<br>3. ගොවිපළ සංවර්ධන ක්‍රියාවලිය පාලනය කිරීම<br>4. වාර්තා සකස් කිරීම |

සකස් කලේ :-
අත්සන : ..................
නම : ..................
තනතුර : ..................
දිනය : 2014/01/24

පරීක්ෂා කලේ :-
අත්සන : ..................
නම : බී. පී. සී. කුලරත්න
අධ්‍යක්ෂ (පරිපාලන)
තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඔල්කට් මාවත, කොළඹ - 10.
දිනය : 2014/01/24

අත්සන ( දෙපාර්තමේන්තු ප්‍රධාන )
..................

නම : ජේ. ක්‍රිෂ්ණමූර්ති,
තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( පරිපාලන හා මූල්‍ය ),
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557, ඔල්කොට් මාවත, කොළඹ - 10.
දිනය : 2014/01/24
නිලමුද්‍රාව ..................